බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

මගේ අංකය / My Number: USJP/EEX-06/2024
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 011-3132496
ෆැක්ස් / Fax: 011-2802753
ලිපිනය / Address: තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකා / Post Box 10, Gangodawila, Nugegoda, Sri Lanka ,
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail: info.ext@sjp.ac.lk

2025.05.30

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## 2023 විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි II කොටස පරීක්ෂණය (නව විෂය නිර්දේශය) සඳහා අයදුම්පත් කැඳවීම - 2025

**01.** ඉහත පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට පහත උපදෙස් අනුගමනය කරන්න

**02.**

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v" අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කරගත හැක. |
| **පරීක්ෂණ ගාස්තු** | **රු.12,000.00** |
| අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. |
| **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** | **2025/07/01** |

සැලකිය යුතුයි

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ.

II. උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික ගෙවීම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025/07/01 වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

V. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VI. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර **external.sjp.ac.lk/ Bachelor of Science Management (Public) General (External) Degree/Examinations/Admission Card** වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය **V** අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

VII. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/ Bachelor of Science Management (Public) General (External) Degree / Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කල හැක.

VIII. **උපාධියක් සම්පූර්ණ කිරීම** : උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ශිෂ්‍ය විවරණිකාව (Prospect ) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** පෙර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.
- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.
- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-05-30